**අක්මීමන ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 07 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට අක්මීමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අය කිරීමේ දී දෙන ලද රු.148,415 ක් වූ වට්ටම, අතිරික්ත හා ඌනතා ගිණුමට හර කර තිබුණි.

(ආ) හිඟහිටි පළාත් සභා ආධාර ගිණුමේ ආරම්භක ශේෂය තුළ වූ 2016 වර්ෂයට අදාළ රු.14,450,827 ක ශේෂය ප්‍රමාණවත් තහවුරු කිරීමකින් හා අනුමැතියකින් තොරව කපාහැර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දේශීය ආදායම් කොමසාරිස්ට ගෙවන ලද රු.139,053 ක් වූ මුද්දර බදු වියදම නිවැරදිව ගිණුම්ගත කර තිබිය දී ජර්නල් සටහන් අංක 36 මගින් ණයහිමි ගිණුම හර කර, සමුච්චිත අරමුදල බැර කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාළව ගෙවන ලද රු.915,052 ක හිඟ වැටුප් ප්‍රතිපූර්ණය, සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ ගිණුම් තබා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.512,570 ක් වූ කර්මාන්ත ණයහිමියන් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.3,187,736 ක දායක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂයේ දී දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් පරිත්‍යාග කරන ලද එකතුව රු.204,640 ක් වූ පරිගණක මධ්‍යම සැකසුම් ඒකක (CPU) දෙක සහ UPS දෙකෙහි පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු උසාවි දඩ මුදල රු.4,857,550 ක් වුවද, ගිණුම්වලට රු.4,649,016 ක් ලෙස ගැලපීමෙන් වර්ෂයේ ආදායම හා ණයගැතියන් රු.208,534 කින් අඩු වී තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයේ උසාවි දඩ ඌන බිල් කිරීම රු.354,334 ක් සමාලෝචිත වර්ෂයේ ජර්නල් සටහන් අංක 48 මගින් රු.462,667 ක් ලෙස ගැලපීමෙන් රු.108,333 කින් ණයගැති ශේෂය හා අතිරික්ත හා ඌණතා ගිණුමේ ශේෂය වැඩි වී තිබුණි.

(ඔ) 2013 - 2017 කාලයට අදාලව සභාවේ සේවකයෙකු විසින් ලබා ගන්නා ලද වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයවිය යුතු රු.148,560 ක් වටිනාකම සම්බන්ධයෙන් ගිණුම් තබා නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.16,436,759 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.204,525 ක් විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ) ලැබිය යුතු ගිණුම්**

-------------------

(i) රු.83,019,761 ක් වූ හිඟහිටි වෙනත් ආදායම් ශේෂය තුළ 2008 සහ 2012 වසරේ සිට පැවත එන රු.76,710,835 ක් වූ මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ii) 2008 වර්ෂයේ සිට පවතින එකතුව රු.1,911,375 ක් වූ ලැබිය යුතු පළාත් සභා ආධාර මුදල් හා 2014 හා 2015 යන වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.165,000 ක් වූ වීථි පහන් ආධාර මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි.

(iii) 2004 වර්ෂයේ සිට පැවත එන රු.1,386,500 ක් වූ පෙර ගෙවුම් ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

--------------------

(i) 2014, 2016 කාලපරිච්ඡේදයට අදාළව මුද්දර ගාස්තු පිළියෙල කිරීමේ කාර්යමණ්ඩල දීමනා රු.90,000 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2008 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.170,958 ක ණයහිමි ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.61,648,302 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම්** |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඔ)වගන්තිය | 205,480 | පළාත් පාලන ක්‍රීඩා උත්සවය සඳහා විෂයභාර ගරු ඇමතිවරයාගේ අනුමැතියකින් තොරව අවස්ථා 05 කදී වියදම් දරා තිබුණි. |
| (ආ) 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනත | 56,270 | ආදේශක සේවකයින් 07 දෙනෙකු සඳහා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක දායක මුදල නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම නිසා, 2017 සැප්තැම්බර් මස අධිභාර මුදලක් සහා අරමුදලින් ගෙවා තිබුණි. |
| (ඇ) **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | |
| (i) රීති 33 | - | එක් එක් කාර්තුවක් අවසානයේ වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර, නොතිබුණි. |
| (ii) රීති 59 | - | සභා බලප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | රීති 145 | - | ආපසු ගෙවිය යුතු තැන්පත් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයන් සකස් කර, ලෙජරයේ දැක්වෙන ශේෂ සමඟ ගැලපීම් කර නොතිබුණි. |
| (iv) | රීති 180 | - | මුදල් භාරව ක්‍රියා කරන නිලධාරීන් හා ආදායම් එකතු කිරීමේ නිලධාරීන් විසින් පත්වීමේ දින සිට මාසයක් ඇතුළත ඇපකරයක් ඉදිරිපත් කළයුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (v) | රීති 217 | - | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ලේඛනයක් අංක පී.එස්.46 දරන ආකෘතිය ප්‍රකාරව පවත්වා යාවත්කාලීන කර නොතිබුණි. |

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

**--------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 102 සිට 110 | - | නැතිවීම් හා හානිවීම් පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර, හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 396(ඇ) | 53,827 | පොදු ගිණුමෙන් නිකුත් කර තිබූ නමුත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ වලංගු කාලය ඉක්මවා තිබූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1645 හා 1646 | - | සභාවට අයත් වාහන 18 ක දෛනික ධාවන සටහන් හා මාසික කාර්යසාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | සභාව සතුව පැවති පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.27,977,943 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,013,279 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,017,000 | 4,804,198 | 3,873,000 | 8,097,992 | 5,217,000 | 4,596,294 | 3,096,611 | 7,166,794 |
| කුලී | 2,869,700 | 2,066,397 | 2,175,252 | 571,100 | 2,660,000 | 2,144,825 | 2,073,750 | 679,955 |
| බලපත්‍ර ගාස්තු | 1,651,000 | 2,502,469 | 2,568,172 | 500 | 1,932,000 | 2,571,190 | 2,614,940 | 66,203 |
| | 9,537,700 | 9,373,064 | 8,616,424 | 8,669,592 | 9,809,000 | 9,312,309 | 7,785,301 | 7,912,952 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.9,537,700 ක් ද, බිල්කළ ආදායම රු.9,373,064 ද, වර්ෂය තුළ රැස් කළ ආදායම රු.8,616,424 ක් ද වූ අතර, හිඟ ආදායම රු.8,669,592 ක් විය.

#### 2.2.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂයට අදාළව අයකර ගතයුතු වූ රු.11,970,992 ක් වූ වරිපනම් බදුවලින්, වර්ෂය තුළ රු.3,873,000 ක් අය වී තිබූ බැවින් වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.8,097,992 ක් විය. ආරම්භක ශේෂයට සාපේක්ෂව අවසාන ශේෂය රු.931,198 කින් වැඩි වී තිබුණි.

#### 2.2.4 කුලී

සමාලෝචිත වර්ෂයට අයවිය යුතු වූ රු.2,746,352 ක කුලී මුදලින් වර්ෂය තුළ අය කිරීම සියයට 79 ක් විය.

**2.2.5** උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.71,933,600 ක් හා උසාවි දඩ රු.9,009,786 ක් විය.

**2.2.6** අධිභාර

--------

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාරයන් 04 කට අදාළව 2017 දෙසැම්බර් 31 දිනට රු.2,682,125 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

**3.1** කාර්යයසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ)** **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 94 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ එකතු කරනු ලබන සියලුම කසළ ප්‍රාදේශීය සභාවේ දේපලක් වියයුතු වුවත්, නොදිරන කසළ පමණක් එකතු කර, බාහිර පුද්ගලයෙකු වෙත ලබා දී තිබුණි.

(ii) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PL/1/5/12 දරන කසළ කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා වූ චක්‍රලේඛය ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 දරන ගැසට් නිවේදනය මඟින් මහජන ආරක්ෂක පනතේ 42 වන අධිකාරිය යටතේ කැළි කසළ සම්බන්ධ සියලුම ක්‍රියාවලින් මෙන්ම විකිණීම ද, යම් පළාත් පාලන ආයතනයක් ඉටු කරනු ලබන අත්‍යවශ්‍ය සේවාවක් බවට පත්කර ඇතත්, සභා බලප්‍රදේශයේ රැස්වන කසළ සම්බන්ධව කිසිදු සැලැස්මක් සහ වැඩපිළිවෙලක් සභාව සතු නොවුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

**-----------------------------**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

**කඩ කාමර බදුදීම**

---------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් ඉදිකරන ලද පින්නදූව වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩමේ අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වූ අතර, අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) වෙළඳ සංකීර්ණයේ අංක 02 කඩ කාමරයෙහි ගිවිසුම් කාලය 2009 සැප්තැම්බර් 24 දිනෙන් අවසන් වී ඇතත්, ගිවිසුම අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) වෙළඳ සංකීර්ණයේ අංක 06 කඩ කාමරයෙන් වර්ෂය තුළ කිසිදු මුදලක් අය වී නොතිබුණු අතර, දෙසැම්බර් 31 දිනට හිඟය රු.177,650 ක් වී තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) (i) කළමනාකරණ සහකාර තනතුරු 03 ක්, ආදාහනාගාර සහායක තනතුරක් හා පුස්තකාල සහායිකා තනතුරක් පුරප්පාඩුව පැවති නමුත්, එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ii) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස සභාව විසින් ආදේශක පදනම මත බඳවාගෙන තිබුණු සේවකයින් 07 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.1,630,827 ක මුදලක් ගෙවා තිබුණි.

**(ආ) සේවක ණය**

---------------

සමාලෝචිත වර්ෂය අවසානයට වූ සේවක ණය ශේෂය තුළ විශ්‍රාම ගිය, ස්ථාන මාරු වී ගිය හා සේවය නතර කළ සේවකයින් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.157,256 ක ණය ශේෂ ඇතුළත් වී තිබූ නමුත්, එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු කැබ් රථයක් වසර 03 කටත් අධික කාලයක සිට සභා භූමියේ ගාල්කර තිබුණි.

(ආ) ට්‍රේලරය සහිත අත් ට්‍රැක්ටරයක් වසර 02 කටත් අධික කාලයක සිට සභා භූමියේ ගාල්කර තිබුණි.

**3.4.2 පවරා නොගත් වත්කම් පරිහරණය**

සභාව විසින් භාවිතා කරන කැබ් රථයක් හා ට්‍රේලරය සහිත ට්‍රැක්ටරයක අයිතිය සභාව සතු නොවීය.

**3.4.3 වාහන උපයෝජනය**

2017 නොවැම්බර් 20 දිනට සභාව සතු කැබ් රථයේ ධාවන සටහන් පොත අනුව මයිලෝ මීටරය කිලෝමීටර් 477448 ක් වූ නමුත්, වාහනයේ මයිලෝ මීටර කියවීම අනුව කිලෝමීටර් 478933 ක් වීමෙන් කිලෝමීටර් 1485 ක වෙනසක් අනාවරණය විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 09 ක එකතුව රු.42,460,644 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 18 සිට සියයට 98 අතර පරාසයක විය.

(ආ) වියදම් විෂයයක අහිතකර විචලනය රු.796,132 ක් වූ අතර, එම වටිනාකම් සියයට 452 ක් විය.

(ඇ) ආදායම් විෂයයන් 05 ක අහිතකර විචලනය රු.15,828,816 ක් වූ අතර, එම වටිනාකම් සියයට 04 සිට සියයට 28 අතර පරාසයක විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | ඉකුත් වර්ෂවල සිට පවතින වත්කම් හා බැරකම් ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| | (ii) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| (ආ) වත්කම් හා දේපල | (i) | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් හා පරිගණක, සම්බන්ධයෙන් වෙන් වෙන්ව ස්ථාවර වත්කම් ලේඛන ද, පවත්වා නොතිබුණි. |
| | (ii) | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ඇ) සේවක මණ්ඩල කළමනාකරණය | (i) | කාර්යය මණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීමටද, අතිරික්ත කාර්යය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) | අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) වාහන පාලනය | (i) | ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| | (ii) | නිෂ්ක්‍රීය වාහන අළුත්වැඩියා කිරීමට / අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) | දෛනික ධාවන සටහන් සහ මාසික කාර්යසාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර නොතිබුණි. |
| | | (ii) | අබලන්ව පැවති කඩ කාමර අළුත්වැඩියා කර, බදු දීමෙන් ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | අයවැය පාලනය | (i) | ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයක් ඇති වී තිබුණි. |
| | | (ii) | ආදායම් හා වියදම් පිළිබඳව පසු විපරම් කර, අයවැය සංශෝධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. |